වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශිය සභාව

වවුනියාව දිස්ත්‍රික්කය

-----------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 11 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 8 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

--------

මෙම වාර්තාවේ 1.3.1 හා 1.3.2 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සදහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති **මූල්‍ය ප්‍රකාශන** මගින් අනාවරණය කර නොතිබුණි.

ආ) උපචිත පදනමට ගිණුම් තබා නොතිබුණි.

ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

ඈ) 2013 දෙසැම්බර් 18 දින මිලදී ගෙන තිබූ වතුර පොම්පයේ වටිනාකම වන රු.17,250ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

ඉ) සමුච්චිත අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය රු. 11,555,527 ක් වූ අතර 2013 මූල්‍ය ප්‍රකාශ වල සමුච්චිත අරමුදල් ආරම්භක ශේෂය රු. 11,867,165 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 311,638 ක වෙනසක් නිරීක්ෂණය විය.

ඊ) 2013 දෙසැම්බර් 31 දින ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීම් ගිණුමේ ශේෂය රු. 41,447,834 වු අතර විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව එම ශේෂය රු. 44,560,885 ක් වුයෙන් රු. 3,113,051 ක වෙනසක් නිරික්ෂණය විය.

උ) 2013 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව 2011 සහ 2012 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 346,010 ක් ලෙස දක්වා තිබුනද එම වර්ෂ වලට අදාලව සභාව වෙත ලැබිය යුතු මුද්දර ගාස්තුව රු.468,917 ක් ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර් වාර්තා කර තිබුණි.

ඌ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් ලෙස රු.638,494 ක් ගිණුම් ගත කර තිබු නමුත් විගණනයට ලැබුණු තොරතුරු අනුව වර්ෂයේ උසාවි දඩ මුදල් ආදායම රු.1,359,659 ක් වූයෙන් ආදායම රු.721,165 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

එ) මුල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු 2,730,929 ක් වුවත් ප්‍රධාන ලෙජරයේ සේවක ණය ගිණුමක් පවත්වා ගෙන නොතිබු නිසා ශේෂයේ නිවැරදි භාවය තහවුරු කරගත නොහැකි විය.

ඒ) සභාව විසින් ප්‍රධාන ලෙජරයක්, සාරාංශ ආදායම් ලේඛණයක් සහ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබු හෙයින් සභාවේ ගණුදෙනු වල සහ වත්කම් හා වගකීම් වල නිවැරදිතාවය සනාථ කර ගැනිමට නොහැකි විය.

1.3.2 <u>**විගණනය සදහා සාක්ෂි නොමැති වීම.**</u>

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්.

------------------------------------

2014 සැප්තැම්බර් 1 දින වන විට එක් විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබු අතර එකී විමසුමට භාජනය වු ගණුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 10,706,781 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම.

----------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 1,093,867 ක් වු ගණුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂනය කිරිමට නොහැකි විය.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.1,176,575 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,036,924 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 ඇස්තමේන්තු ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්

-----------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත රු.000 | තථ්‍ය රු.000 | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය රු.000 |
|---|---|---|---|
| (i) බදු කුලී | 120,000 | 431,587 | 60,650 |
| (ii) බලපත්‍ර ගාස්තු | 2,040,000 | 870,990 | _ |
| (iii) වෙනත් ආදායම් | 19,608,507 | 12,948,546 | 1,912,061 |

2.2.2 බදු කුලී

----------

පහත සඳහන් නිරීක්ෂනයන් කරණු ලැබේ.

(අ) 2008 සැප්තැම්බර් 25 දිනැති අංක ආමප/08/1737/306/110 දරන අමාත්‍ය මණ්ඩල ලේකම් ගේ ලිපිය අනුව කඩ කුලි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුකරවා ගත යුතු වුවත් එසේ සිදුකර නොගෙන සභාව විසින් තීරණය කල ගාස්තු අය කර තිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 05ක් ඌණ උපයෝජිතව පැවති බව නිරික්ෂනය වූ අතර එයින් සභාවට අහිමි වූ අදායම රු.36,500 ක් විය.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවම වශයෙන් වසර 5කට වරක් කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

---------------

වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකර වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු ස්ථාන පිළිබඳව හදුනාගෙන නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-----------------

සභා බල ප්‍රදේශය තුල සති පොළවල් පවත්වන භූමි ප්‍රමානය, පැමිනෙන වාහන සංඛ්‍යාව වෙළදාම් කරන වෙළදුන් සංඛ්‍යාව පාරිභෝගිකයන් සංඛ්‍යාව ,වෙළදාම් කරන භාණ්ඩ වර්ග, පොළ වෙනුවෙන් ලබා දි ඇති පහසුකම් ආදිය පිලිබද සමීක්ෂණය කර ලැබිය යුතු ආදායම් පිලිබද තීරණය කර ඒ අනුව ආදායම් අය කර ගැනිමට කටයුතු කර නොතිබු අතර සභා තීරණ මගින් ගාස්තු තීරණය කර තිබුණි.

2.2.5 උසවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,083,769 ක් හා මුද්දර ගාස්තු රු. 468,917 ක් ලැබිය යුතුව තිබුණි.

2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------

සභාව සතු වාහන 13ක් වසරකට වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පවතින බවත් එයින් වාහන 10 ක් කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු වල යෙදවිමේන් ආදායම් ඉපයීමට හැකිව තිබු බව නිරික්ෂණය විය.

2.4 කළමණාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------------------------------

(අ) <u>කළමණාකරණ අකාර්යක්ෂමතා</u>

(i) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.1,972,711ක් වූ අතර එම වටිනාකම තුල වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.813,542 ක් විය.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට සභාව සතු බැංකු ජංගම ගිණුමක ශේෂය රු. 4,716,060 ක් වූ අතර එම මුදල් කිසියම් කෙටිකාලීන ආයෝජනයක යොදවා පොලි අදායමක් උපයා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

අපහරනය කලයුතු භාණ්ඩ සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය මගින් ලබා දි ඇති උපදෙස් අනුව කටයුතු සිදුකර නොතිබුණි.

2.5 කාර්ය සාධනය

--------------------

පහත සදහන් නිරික්ෂනයන් කරණු ලැබේ.

අ) 2013 අයවැය ලේඛනය මගින් වැය විෂයන් 25 ක් සඳහා වෙන්කරන ලද රු.3,123,000 මුදලක් ඌණ උපයෝජිතව පැවතුනි.

ආ) අයවැය ලේඛනය මගින් සමාලෝචිත වර්ෂයේ ඉටු කිරිමට සැලසුම් කර තිබු රු. 2,300,000 ක්වූ සුභ සාධන ව්‍යාපෘති 2ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඇ) ආදායම් තත්වයන් වැඩි දියුනු කිරීමට යෝජනාවක් ලෙස ත්‍රිරෝද රථ නැවතුම් පොළවල් ලියා පදිංචි කොට ගාස්තු අය කිරිමට 2011 ජුනි 20 හා 2013 අප්‍රේල් 22 පැවති සභා රැස්වීම් වලදි තීරණය කර තිබු නමුත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඇ) 2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක | 02 | 01 | 01 |
| ද්විතික | 20 | 18 | 02 |
| ප්‍රාථමික | 27 | 13 | 14 |
| | 49 | 32 | 17 |

පුරප්පාඩුව පවතින තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය